සියලු ම හිමිකම් ඇවිරිණි.
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගැයීම
இரண்டாம் தவணை மதிப்பீடு - 2018
Second Term Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 09 | විෂය / பாடம் / Subject | ඉස්ලාම් | පත්‍රය / வினாத்தாள் / Paper | I,II | පැය / மணித்தியாலம் / Hours | 2 |
|---|---|---|---|---|---|---|---|

## කොටස - I

**● සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. 'ජාමිඋල් කුර්ආන්' යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
   1. උමර් රලියල්ලාහු අන්හු
   2. අබූබක්කර් රලියල්ලාහු අන්හු
   3. උස්මාන් රලියල්ලාහු අන්හු
   4. අලි රලියල්ලාහු අන්හු

2. පව් සමවා අයැදීම සඳහා ඉතා සුදුසු අවස්ථාව වනුයේ,
   1. තහජ්ජත් වේලාව
   2. ජුම්ආ දිනය
   3. අරෆා දිනය
   4. රමළාන් මාසය

3. හජ් අනිවාර්ය වූ හිජ්රි වර්ෂය,
   1. 8
   2. 10
   3. 9
   4. 7

4. කලීෆා අබූබක්කර් රලියල්ලාහු අන්හුතුමාගේ කාලයේ සිදු වූ යුද්ධය,
   1. නහර්වාන්
   2. ආර්මීනියා
   3. සිෆ්ෆීන්
   4. යමාමා

5. අල්කුර්ආනයේ 93වන සූරාව වනුයේ ,
   1. සූරා වාකියා
   2. සූරා ලුහා
   3. සූරා මායිදා
   4. සූරා ෆුර්කාන්

6. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම්තුමාණන් හජ් වන්දනාව සඳහා යෑමේදී මදීනාවේ භාරකරු ලෙස පත්කළ සහාබිවරයා,
   1. අබූබක්කර් රලියල්ලාහු අන්හු
   2. උමර් රලියල්ලාහු අන්හු
   3. අබූ තුජානා රලියල්ලාහු අන්හු
   4. මුස්අබ් රලියල්ලාහු අන්හු

7. සහීහුල් බුහාරි, සහීහුල් මුස්ලිම් යන ග්‍රන්ථවල අඩංගු හදීස් සංඛ්‍යාව,
   1. 7275 හා 4800
   2. 4800 හා 4000
   3. 7275 හා 4000
   4. 4000 හා 7275

8. 'මහබ්බතුර් රසූල්' යන්නෙන් අදහස් කරන්නේ,
   1. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම්තුමාගේ මග පිළිපැදීම.
   2. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම්තුමා කෙරෙහි ආදරය තැබීම.
   3. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම්තුමාගේ යහළුවන් ආදරය කිරීම.
   4. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම්තුමාට ගරුකිරීම.

9. මක්කා කාෆිර්වරුන් විසින් එල්ලුම් ගසෙහි නංවා දරුණු ලෙස හිරිහැර කළ සහාබිවරයා,

1. සෙද් බින් තාබිත් රලියල්ලාහු අන්හුතුමා

2. සෙද් බින් හාරිදා රලියල්ලාහු අන්හුතුමා

3. සෙද් බින් තාසිනා රලියල්ලාහු අන්හුතුමා

4. සෙද් බින් සඊද් රලියල්ලාහු අන්හුතුමා

10. හදීස් කලාව උච්චස්ථානයතෙක් වර්ධනය වුයේ,

1. නබි සල්ලල්ලාහු අලෛහිස්සලාම්තුමාගේ කාලය 2. සහාබිවරුන්ගේ කාලය

3. තාබිඊන්වරුන්ගේ කාලය 4. තබඋත් තාබිඊන්වරුන්ගේ කාලය

11. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ අවසන් හජ් දේශනය ජනතාව අතර ශබ්ද නගා කියන ලද්දේ,

1. බිලාල් රලියල්ලාහු අන්හු

2. අබූබක්කර් රලියල්ලාහු අන්හු

3. රබීඅත් ඉබ්නු උමෛයා රලියල්ලාහු අන්හු

4. අබූසුෆ්යාන් ඉබ්නු උමෛයා (රලි) අන්හු

12. ''සහීහෙන්'' යනුවෙන් හඳුන්වනු ලබන හදීස් ග්‍රන්ථයන්,

1. සහීහුල් බුහාරි, සුනන් ඉබ්නු මාජා 2. සහීහුල් මුස්ලිම්, සුනන් නසාඊ

3. සහීහුල් බුහාරි, සහීහුල් මුස්ලිම් 4. ජාමිඋත් තිර්මිදි, සුනන් අබූදාවූත්

13. අල්කුර්ආනය ග්‍රන්ථකරන කිරීමේ කමිටුව භාරව කටයුතුකළ සහාබිවරයා,

1. සෙද් බින් හාරිදා රලියල්ලාහු අන්හු 2. අබූබක්කර් රලියල්ලාහු අන්හු

3. සෙද් බින් සාබිත් රලියල්ලාහු අන්හු 4. උමර් රලියල්ලාහු අන්හු

14. 'මස්ජිද්' යන වචනයෙහි තේරුම,

1. සලාතය ඉටුකරන තැන 2. කුත්බා ඉටුකරන තැන

3. සුජූද් කරන තැන 4. හදීස් දේශන කරන තැන

15. හජ් ක්‍රියාවන් ආරම්භවන දිනය,

1. දුල්හජ් 1 2. දුල්හජ් 10 3. දුල්හජ් 8 4. දුල්හජ් 7

16. ''තර්තීබුත් තිලාවත්'' යන්නෙන් හඳුන්වනු ලබන්නේ ,

1. අල්කුර්ආනය පහළවූ පිළිවෙල

2. අල්කුර්ආනය පාරායනය කරන පිළිවෙල

3. අල්කුර්ආනය ලියනලද පිළිවෙල

4. අල්කුර්ආනය ගොනු කරන ලද පිළිවෙල

17. A කොටස හා B කොටස නිවැරදිව ගළපා ලියූවිට පිළිතුර වන්නේ,

| A | B |
|---|---|
| 1. ඉමාම් බුහාරි (රහ්) | A. සජස්තාන් |
| 2. ඉමාම් මුස්ලිම් (රහ්) | B. කස්වීන් |
| 3. ඉමාම් ඉබ්නු මාජා (රහ්) | C. නෛසාපූර් |
| 4. ඉමාම් අබූදාවූද් (රහ්) | D. බුහාරා |

1. ABCD 2. DCBA 3. CDAB 4. DCAB

18. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන්ට ප්‍රථමයෙන් පහළවූ අල්කුර්ආන් වචනය සඳහන් සූරාව,

1. සූරා ෆුර්කාන් 2. සූරා අලක් 3. සූරා තෞබා 4. සූරා මුල්ක්

19. සූරා ලුහාහි ඇති වචන ගණන,

1. 10 2. 14 3. 11 4. 16

20. 'ජම්රා' පිහිටා ඇති ස්ථාන,

1. අරෆා 2. මුස්තලිෆා 3. මදීනා 4. මිනා

(2×20 = 40 ලකුණු)

***

# කොටස - II

- **ඕනෑම ප්‍රශ්න පහක් තෝරා උත්තර ලියන්න.**

(01) 1. හජ් වගකීම ඉටුකළ හැකි ආකාර **3** සඳහන් කරන්න.
2. හජ් හි අර්කාන් සඳහන් කරන්න.
3. හජ් හි ප්‍රයෝජන **3**ක් සඳහන් ලියන්න.

(02) 1. ''පරමාන්ත දිනයේ දී කරුණු **හතරකට** පිළිතුරු නොදෙන තුරු කිසිදු මිනිසෙකුට ඉවත්ව යා නොහැකිය.'' යනුවෙන් හදීසි සඳහන් වූ එම කරුණු **හතර** ලියන්න.
2. ''කරුණු පහක් සිදුවීමට පෙර කරුණු පහක් ප්‍රයෝජනයට ගන්න.'' යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමන් විසින් අවධාරණය කළ දේවල් ලියන්න.
3. කලීෆා අබූබක්කර් රලියල්ලාහු අන්හු තුමානන්ගේ පාලන සමයේදී අඛණ්ඩ ලෙස දැක ගත හැකි වාර්තාවන් 03ක් සඳහන් කරන්න.

(03) 1. 'ආදාබුල් මස්ජිද්' යනු කුමක් ද?.
2. මස්ජිද් තුළ රැකිය යුතු විනයන් 03**ක්** සඳහන් කරන්න.
3. මස්ජිද් තුළ නොකළ යුතු යැයි වළක්වන ලද ක්‍රියාවන් 03**ක්** සඳහන් කරන්න.

(04) 1. අල්කුර්ආනයේ සඳහන් වන පරිදි නබි ආදම් අලෛහිස්සලාත්තු වස්සලාම් තුමානන් පව් සමාව අයැදු වචනය ලියන්න.
2. අල්ලාහු තආලාගෙන් පව් සමාව අයැදු යැයි අල්කුර්ආනයේ සඳහන් නබිවරුන් 04 දෙනෙකුගේ නම් ලියන්න.
3. පව් සමාව අයැදීම සඳහා වූ කොන්දේසි 04ක් සඳහන් කරන්න.

(05) 1. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන්ට ප්‍රථමවරට වහී පහළවූ ආකාරය කෙටියෙන් විස්තර කරන්න.
2. අල්කුර්ආනය ගොනුකළ අයුරු පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

(06) 1. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමානන්ගේ අවසන් හජ් දේශනය අන්තර්ගතවූ කරුණු 03ක් සඳහන් කරන්න.
2. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමානන් කෙරෙහි ආදරය දැක්විය යුතු මන්දැයි යන්නට හේතු කරුණු 03 ක් සඳහන් කරන්න.
3. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමානන් කෙරෙහි ආදරය දැක්වෙන ක්‍රියාවන් 03ක් සඳහන් කරන්න.

(07) 1. හදීස් කලාවේ ඉමාම්වරු 06 දෙනාගේ නම් සඳහන් කරන්න.
2. 'සුනන් අර්බආ' යනුවෙන් හඳුන්වනු ලබන හදීස් ග්‍රන්ථයන් කුමක් ද?
3. ඉමාම් බුහාරි රහ්මතුල්ලාහ්ගේ ජීවිත ඉතිහාසය කෙටියෙන් දක්වන්න.